# ස යු රෙ න් එතෙර

**එතෙර ශ්‍රමයට මෙතෙර උපහාරය**

පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී.
1 වන කාණ්ඩය 3 වන කලාපය
2020 සැප්තැම්බර්

ගැඹුරු නිලැති සිහිලස පිරි ජල විලට
සොඳුරු බලැති හැඩ ගෙනදුන් පිරිවරට
රුදුරු බලැති සතපා එය කළ නිවට
ගොඳුරු වැටෙති පිට සක්වල කොක් කටට

එස්. ඒ. එල්. ප්‍රේමකුමාර



ජායාරූපය : ධනුෂ්ක බැරගම

ස යු රේ නෑ

# එතෙර

එතෙර ශ්‍රමයට මෙතෙර උපහාරය

අංක 450, ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව.
දුරකථන : +94 11 2689500-508 ෆැක්ස් : +94 11 2689510/2674347
ඊ මේල් : csl123@sltnet.lk අන්තර්ජාලය : www. ceylonshippinlines.com




# මාලිගාවිල ප්‍රතිමා විහාරය

**මාලිගාවිල මෙම ප්‍රතිමා විහාරය ලෝක අවධානයට ලක්වී ඇත්තේද මෙම සුවිසල් හිටි පිළිමය නිසාය. පුරාණ හෙළ ජනයාගේ කායික මානසික ශක්තිය හා ඔවුන් තුළ බෞද්ධාගම කෙරෙහි තිබූ ශ්‍රද්ධාසම්පන්න භක්තිය එයින් පිළිබිඹු වෙයි. අඩි 37 අඟල් 10ක් උස පිළිමය බිම හෙලා කෙසේ නම් කෙලින් කර තැබුවා දැයි අදද සිතා ගත නොහැක. විද්වතුන්ගේ මතය අනුව මෙම කළු ගල පිටස්තර ස්ථානයකින් මෙතනට ගෙනවිත් බිම තබා ප්‍රතිමාව නෙලා පද්මාසනය උඩ සිටුවා ඇත.**

**වැල්ලවාය මොනරාගල (ඒ 4 මාර්ගය) අතර කුඹුක්කන සිට කි: මී: 12 ක් දුරින් පිහිටි ඔක්කම්පිටිය නගරයේ සිට කි: මී: 5 ක් දුරින් මාලිගාවිල පුරා විද්‍යා භූමිය පිහිටා ඇත. ගොවිජන පද සහිත කෙත්වතු වලින් ගහන මැණික් ආදී වටිනා ඛණිජ ද්‍රව්‍ය ද පළු බුරුත කළුවර ආදී වටිනා දැවයන්ගෙන් ද ගහන ප්‍රදේශයක මාලිගාවිල පුද බිම පිහිටා ඇත. මෙම ප්‍රදේශය පුරා ඓතිහාසික නටබුන් විසිරී ඇත. මෙම ප්‍රදේශය 1936 දී පුරා විද්‍යා රක්ෂිතයක් බවට පත්විය.**

මහා වංශයට අනුව හත්වන සියවසේ විසූ ඔක්කාක වංශයේ මහාතිස්ස සහ ඔහුගේ බිරිඳ සංඝසීමාට පුතුන් තිදෙනෙකු හා දියණියක් වූහ. ඉන් පළමුවැන්නා අග්බෝය. දෙවැන්නා දප්පලය. තෙවැන්නා මිණිඅක් ය. මින් අග්බෝ රුහුණේ ධනවත්ව විසූ නිදහස් රජෙක් විය. මොහු බොහෝ පින් දහම් කරමින් දුගී මගී යාචකාදීන්ට සත්කාර කළේය. ඔහු කළ බොහෝ දේ අතර මාළිගා විල පතිමා විහාරයේ විශාල ශෛලමය බුද්ධ ප්‍රතිමාව ද එකකි. මේ තොරතුරු මහා වංශයේ 43 වන පරිඡේදයේ දක්වා ඇත.

මාලිගාවිල මෙම පතිමා විහාරය ලෝක අවධානයට ලක්වී ඇත්තේද මෙම සුවිසල් හිටි පිළිමය නිසාය. පුරාණ හෙළ ජනයාගේ කායික මානසික ශක්තිය හා ඔවුන් තුළ



බෞද්ධාගම කෙරෙහි තිබූ ශ්‍රද්ධාසම්පන්න භක්තිය එයින් පිළිබිඹු වෙයි. අඩි 37 අඟල් 10ක් උස පිළිමය බිම හෙලා කෙසේ නම් කෙලින් කර තැබුවා දැයි අදද සිතා ගත නොහැක. විද්වතුන්ගේ මතය මෙම කළු ගල පිටස්තර ස්ථානයකින් මෙතනට ගෙනවිත් බිම තබා ප්‍රතිමාව නෙලා පද්මාසනය උඩ සිටුවා ඇති බවයි.

1908 දී මෙම පිළිමය බිම පතිත වී ඇත. ඒ නිදන් සොරුන් විසින් පාදමට බෝර ගසා නිදන් සෙවීම නිසාය. අනතුරුව 1912 දී ද පිළිමයේ උදර ප්‍රදේශයට බෝර ගසා නිදන් සොයා ඇත. 1977 දී මෙය ඔසවා තැබීමට එකල තිබූ යන්ත්‍රෝපකරණවලට හැකියාව නොතිබුණා පමණක් නොව එසවීමට ගොස් බිම වැටී බිඳී ගියේය. අනතුරුව 1991 දී එය කොටස් වශයෙන් ඔසවා අද ඇති තත්ත්වයට පත්කර ඇත.

හත්වන සියවස තරම් ඈත යුගයක මිනිසුන් මෙම සුවිසල් ගල් කුට්ටිය මෙම ස්ථානයට රැගෙන විත් අලංකාර බුදු රුවක් නිමවා එය කෙළින් සිටුවූයේ කුමන තාක්ෂණයක් උපයෝගි කරගන දැයි අද ද අදහා ගත නොහැක. එකල මෙය තිබී ඇත්තේ ගෘහයක් තුළය. එය අඩි 60ක් වත් උස්ම තැබෙන්නට ඇතැයි සිතිය හැක. එම ප්‍රතිමා ගෘහයේ බිත්තියක් පළලින් අඩි 14කි. එම බිත්ති හතර අතර දුර අඩි සියය බැගින් වූ සම චතුරශ්‍රයකි. වහලයද ගඩොලින් තැනූ ගෝලාකාර එකක් විය හැකියැයි අනුමාන කරන්නේ උළු කැටයක් හෝ වහළයක කොටසක් අවටින් සොයාගත නොහැකි බැවිනි.

මේ අවට සංඝාවාස පොකුණු විහාර මන්දිර ආදියේ නටබුන් පිහිටා ඇත. අතීතයේ දී විශාල ප්‍රදේශයක් ආවරණය කරමින් පූජා ප්‍රදේශයක් වශයෙන් මෙම ස්ථානය පිහිටා තිබුණ බව සිතා ගැනීම අපහසු නොවේ.


ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට
පිටරට සිට එවන මුදල් ලබාගන්නා ඔබ සඳහාම
විශේෂිත රෙමිටන්ස් කාඩ්පතක්
Remittance Card
COMMERCIAL BANK
1234 4567 1234 4567
5189
VALID THRU
MONTH/YEAR
10 / 20
VISA
ඔබේ රෙමිටන්ස් කාඩ්පත අදම ලබාගෙන මෙම සියලු වාසි අත්විඳින්න.
● ආරම්භක ගාස්තු නොමැතිව නොමිලේ කාඩ්පතක් ලැබීම.
● පිටරට සිට ලැබෙන මුදල් එසැණින් ඔබගේ ගිණුමට ලැබීම.
● දවසේ ඕනෑම වේලාවක මුදල් ලබාගැනීමට දිවයින පුරා විහිදුනු ATM ජාලය.
● විවිධ භාණ්ඩ හා සේවා මිලදී ගැනීමට Debit Card පතක් ලෙසින්ද ශ්‍රී ලංකාවේ සහ පිටරට දී භාවිතා කිරීමේ හැකියාව.
● කාඩ්පත් හිමියන් සඳහා වසර පුරා හිමිවන සුවිශේෂී වට්ටම් හා දීමනා.
● පිටරට සිට එවන මුදල් ලබාගන්නන් හට ලබාදෙන සුවිශේෂී 'එහ@සි ණය' පහසුකම.
● බැංකුව මගින් පවත්වන ප්‍රවර්ධන වැඩසටහන් වලදී වැඩි දිනුම් අවස්ථා හිමිවීම.
● බැංකුවේ සුවිශේෂී ගණුදෙනුකරුවන් හට හිමිවන වරප්‍රසාද වැඩසටහන් සඳහා සුදුසුකම් ලැබීම.
කොමර්ෂල් බැංකුවේ e-Exchange, වෙලාවට පරිස්සමට පිටරට සිට මුදල්
100 YEARS
COMMERCIAL BANK
*කොන්දේසි සහිතයි | Fitch Rating AA (lka) | +94 112 353 576 | www.combank.lk
ඔබේ ජය අපේ පැතුමයි

# රෝග රැසකින් සිරුර සුරකින සාරණ



පරිප්පු මිටක් දමා සාරන ටිකක් ඉඳහිට පිළියෙල කර ගත්තද සාරණ ඖෂධීය ගුණයෙන් ඉහළ ඖෂධ පත්‍රයක් හෝ ආයුර්වේද ප්‍රතිකාර සඳහා යොදා ගැනෙන පත්‍ර විශේෂයක් බව ඇතැම් විට නොදන්නවා විය හැක.

සම්පූර්ණ ශාකයම ඖෂධ සඳහා ප්‍රයෝග කෙරෙන අතර ප්‍රධාන වශයෙන්ම යොදා ගනුයේ මුල්ය. ශාකයේ විවිධ කොටස්වල ඖෂධීය ගුණ හා කර්ම වෙනස් වන අතර උදාහරණයක් ලෙසට සාරණ පත්‍රය ශීත වීර්යෙන් යුතු අතර මුල් පද්ධතිය උෂ්ණ වීර්යයෙන් යුක්තය. ප්‍රභේදකරණයේදී රතු සාරණ හා සුදු සාරණ ලෙස වර්ග දෙකකට බෙදේ. ආයුර්වේදයට අනුව සාරණ යනු ත්‍රිදෝෂ සමනය කෙරෙනා ඖෂධීය පලා විශේෂයකි.

මධුර, තිත්ත හා කෂාය ගුණ ත්‍රිත්වයෙන්ද ලඝු හා රූක්ෂ ගුණයෙන්ද උෂ්ණ වීර්යයෙන්ද යුතු සාරණ, දේහයේ විෂ නසනා බව ආයුර්වේදයේ පෙන්වා දේ.

හෘදයටද ඉතා හිතකර පලා විශේෂයකි. ශරීරයේ වේදනාව හා ඉදිමුම් නැති කරවන සාරණ වේදනා නාශක ගුණයෙන්ද ඉහළය.

සාරණ සතු ඖෂධීය ගුණය හේතුවෙන් මළ අනුලෝවනය හෙවත් මළ පහළට යොමු කිරීම සිදු කරයි. එම නිසාම මළ පිටවීමේ අර්බුද ඇති රෝගීන්ටද සාරණ ඉතා යෝග්‍යය.



මුත්‍ර ජනනය උත්තේජනය කර මුත්‍රා මාර්ගයද ශෝධනය කරවීමේ ගුණයක්ද සාරණ සතුය. ස්වේද ග්‍රන්ථි උත්තේජනය කර දහඩිය දැමීම වැඩි කිරීමේ හැකියාවක්ද සාරණ සතුය.

කුෂ්ඨ රෝග, සමේ රෝග ඇති විට එම තත්ත්වය පාලනය කිරීමටද සාරණ භාවිතයට ගැනේ.

සාරණ සතු රසායන සංයෝගයෙන් දේහය ලෙඩ රෝග වලින් ආරක්ෂා කෙරෙනා ප්‍රතිශක්තිය පාලනය කෙරෙන අතරම, වයසට යාම පාලනය කිරීමටත් උපකාරී වේ. වාජිකරණය හෙවත් ලිංගික ශක්තිය වඩවාලීමටද සාරණ උපකාරී වේ.

සාරණවල ඇල්කලොයිඩ් මෙද අම්ල ඇමයිනෝ අම්ල ප්‍රති ඔක්සිකාරක විටමින් A,C හා B ද යකඩ කැල්සියම් හා පොටෑසියම් ඉහළ සංයුතියක් ඇති බව නූතන පර්යේෂනවලින් පවා තහවුරු කර තිබේ.

මුත්‍රා රෝග, ශෝථ, උණ, ආමවාත හා සන්ධිගත වාත, මුතුගල්, පාණ්ඩු රෝග හා රක්තහීනතාව, අක්මා හා ප්ලීහා රෝග, අක්ෂි රෝග, කුෂ්ඨ රෝග හා විෂ ශිරෝ රෝග, ස්නායු රෝග, ගෙඩි හා විද්‍රධි තත්ත්ව, දන්ත හා මුඛ රෝග වැනි විශාල රෝග පරාසයක් සඳහා සාරණ ආයුර්වේදයේ මෙන්ම දේශීය චිකිත්සාවද ප්‍රයෝග කෙරේ.

මුත්‍ර අඩස්සියටත්, මුත්‍ර අපහසුවෙන් පිටවන තත්ත්වයේදීත් මුත්‍ර දැවිල්ල හා වේදනා සහිතව මුත්‍ර පිට කිරීමේදීත් සහ මුත්‍ර ගල් ඇති රෝගීන්ටත් සාරණ කෂාය ඉතාම වටිනා ඖෂධයකි.



දේහයේ ඉදිමුම් හා වේදන සහිත තත්ත්වවලදීත්, වේදනා සමනයටත් ඉදිමුම් නැති කිරීමටත් සාරණ මුල්, බැබිල මුල්, වෙනිවැල් ගැට තැම්බූ වතුර නිතර පානය කිරීම ගුණදායකය.

සන්ධිගත වාත රෝග හා ආමවාත වැනි රෝග සඳහා සාරණ මුල් නිකපොතු, බැබිල, සුදු ලූනු කෂාය ඉතාම ගුණදායකය. වේදනා සමනයටත් ඉදිමුම නැති කිරීමටත්, අසාදන හා අසාත්මිකතා මැඩලීමටත් පමණක් නොව ගෙවී ගිය කාටිලේජ් නැවත වර්ධනයටත් සාරන සතු හැකියාව ඉහළය.

විවිධ කුෂ්ඨ රෝග ඇති විට හෝ සමේ කැසීම් තුවාල දද, බැක්ටීරියා හා දිලීර ආසාධන ඇතිවිටත් සාරණ සහමුලින් ගෙන හොඳින් පිරිසිදු කර ඇල්දියේන අඹරා ආල්පකිරීමෙන් ගුණ ලැබේ.

ආයුර්වේදයේ පෙන්වා දෙන්නේ රතු සාරණ අක්මාවට ඉතාම හිතකර බවයි.

ඇස් වලටද ඉතාම හිතකර සාරණ අක්ෂි රෝග රාශියක් සඳහා ප්‍රයෝග කරනා වටිනා ඔසුවකි. විශේෂයෙන්ම වයසට යාමත් සමඟ ඇති වන පෙනීමේ දුර්වලතා සඳහාත් රාත්‍රී අන්ධ භාවය වැනි රෝග සඳහාත් සාරණ මුල් ඇල් දියෙන් හෝ තලතෙලින් අඹරා අංජන ලෙස ඇසේ ආලේප කිරීම සිදුකරයි.

ඇසේ රතට රතු සාරණ මුල් මී පැණියෙන් අඹරා ඇස වටා ආලේපය හෙවත් පුරවලියම් යෙදීමෙන් රතු හා වේදනාව සමනය කර ගත හැක.

උදරාබාධ හා ගුල්ම රෝගවලදී සාරණ කොළ යුෂ එළුකිරි හා කලවම්කර පානය කිරීම සුදුසුය.

ඉතා ඉහළ ආහාරමය තන්තු ප්‍රමාණයක් අන්තර්ගතව සාරණ මල පහ එළ ප්‍රමාණය වැඩි කරවයි. මල පහළට යොමු කිරීම හෙවත් මළ අනුලෝමනය කරවීමේ ගුණයකින්ද යුක්තය. මල බද්දය වලකා අර්ශස් රෝග, ආහාර මාර්ගය ආශ්‍රිත තුවාල, පිළිකා වැනි භයානක රෝග තත්ව වලින් ද ආරක්ෂා කර දෙයි. ශීත ගුණයෙන් යුතු සාරණ කොළ ආහාරයට ගැනීමෙන් බඩේ දැවිල්ල අම්ල පිත්ත වැනි රෝග තත්ත්වයද සුව වේ. පණු රෝග සඳහා සාරණ ගුණදායක ආහාරයකි.

පාණ්ඩු හා රක්තහීනතාව වැනි රෝගවලින් ආරක්ෂා වීමට සාරණ ඉතාම යෝග්‍ය අතර යකඩ ඇතුළු අත්‍යාවශ්‍ය ඛනිජ ලවන රාශියක් අන්තර්ගත වන නිසාම රුධිරයේ හිමෝග්ලොබින් මට්ටම අඩු අවස්ථාවන්හි දී නිතර කෑමට ගැනීම සුදුසුය. ඉහළ විටමින් බී සංයුතියකින් යුතු සාරණ ස්නායු පද්ධතියට හොඳ ඔසුවකි. මොළයේ හා ස්නායු පද්ධතියේ ක්‍රියා ක්‍රමවත් කරවන සාරණ මානසික සෞඛ්‍යය වඩවාලීමට ද උපකාරී වේ.

නින්ද නොයන රෝගීන්ටද සාරණ කෂාය ගුණදායකය.

මී විෂ, සර්ප විෂ, ගෝනුසු විෂ හා පත්තෑ විෂට සාරණ මුල් ඇල්දියෙන් අඹරා ආලේප කිරීමෙන් යම් සහනයක් ලැබේ.

පාද පැලීම, තොල් පැලීම, දත් කැක්කුම, මුඛයේ තුවාල හට ගැනීම වැනි රෝග සඳහා ද සාරණ නිතර ආහාරයට ගැනීම ගුණදායක බව පොත පතේ සඳහන්ය.

විවිධ හේතූන් නිසා ශරීරයේ ඇති වන කැළැල් මකා දැමීමට අරළු, රත්හඳුන්, වෙනිවැල්, වැල් මඳට කුඩු වලින් ස්ක්‍රබ් කර එම ස්ථානය සාරණ මුල්, සමන් පිච්ච කොළ තැම්බූ වතුරින් සෝදා දැමීමෙන් කැළැල් මැකී යයි. ඉහළ ප්‍රති ඔක්සිකාරක ගුණ සහිත ඔසුවක් වන සාරණ සෛලීය පරිවෘත්තිය ක්‍රියා හොඳින් පාලනය කිරීමට මෙන්ම උත්තේජනයටද උපකාරී වේ.




# පිටරට සිට ශ්‍රී ලංකාවට මුදල් එවන්න

පහසු, ආරක්ෂිත, වේගවත් ක්‍රම රැසක් දැන් සෙලාන් බැංකුවෙන්

**සෙලාන් බැංකුවට මුදල් එවිය හැකි මුදල් හුවමාරු සේවා**

Trans-Fast Worldwide Money Transfer | LuLu Money | Instant Cash Global Money Transfer | Speedcash Now | Ria Money Transfer

Unistream Money Transfers | Worldwide Cash Express Money Transfer | Speed Send | samba | Placid Express

Alfardan Exchange | TeleMoney | Enjaz | Western Union WU | Fawri

**ඔබ වෙනුවෙන් සේවයට කැප වූ සෙලාන් බැංකු නියෝජිතයා**

සවුදි අරාබිය — කාංචන හේමකීර්ති : 00966 559300872

*කොන්දේසි සහිතයි

www.seylan.lk

+94 11 200 88 88

සෙලාන් බැංකුව — සුහද හදක් ඇති දේශීය බැංකුව

Brand Finance Rating "A+" Fitch Rating: 'A (lka)' සමාගම ලියාපදිංචි අංකය: PQ 9 සෙලාන් බැංකුව ශ්‍රී ලංකා මහ බැංකුවේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන බලපත්‍රලාභී වාණිජ බැංකුවකි

# අවසන් වසරේ වෛද්‍ය සිසුවියගේ කතාව...



**● තාත්ත කළේ පොල් කඩන එක අම්ම දලු කැඩුවා ඇත්තටම.**

**● මම ගමේ පාසලට ගියේ. මම ඉගෙන ගන්න දක්ෂ ළමයෙක් නෙවෙයි.**

**● කටුමැටි ගහපු ගෙදරක තමයි අපි ජීවත් උනේ.**

**● මම ටවුමේ ගාමන්ට් එකේ වැඩට ගියා..**

**පසුගිය දිනවල සමාජ ජාලා හරහා හුවමාරු වූ මෙම කතාව උත්සාහය උනන්දුව ධෛර්ය සම්පන්න බව මැනවින් කියාපාන ආදර්ශවත් කතාවකි. දුප්පත්කම ජය ගැනීමට ඇති එකම මාර්ගය මෙම ලිපියෙන් සොයා ගැනීම අපහසු නොවේ. ඒ නිසා එම කතාව එළෙසම අපි මෙසේ පළකරමු.**

මගේ පවුලේ 4 දෙනයි. මමයි මල්ලියි අම්මයි තාත්තයි. තාත්ත කළේ පොල් කඩන එක අම්ම දලු කැඩුවා ඇත්තටම.

මම ගමේ පාසලට ගියේ. මම ඉගෙන ගන්න දක්ෂ ළමයෙක් නෙවෙයි. අපිට පොඩිකාලෙ ඉදන්ම ඉගෙන ගන්න ඕන කියන එක ඔලුවෙ තිබුණේ නැහැ. කොහොමද හොඳට ජීවත් වෙන්නේ... කොහොමද හොඳට කන්නේ බොන්නේ... හොඳට අඳින්න ඕන.... ඒ එකක්වත් හිතට හරියන විදියට ලැබුණේ නෑ... දුකම තමයි උරුම වෙලා තිබුණේ...

අම්මයි තාත්තයි ගෙවන්න ගත්ත ඉඩමක යන්තම් කටුමැටි ගහපු ගෙදරක තමයි අපි ජීවත් උනේ ... කාමර 2 යි. කුස්සිය එළියෙන්.. පොඩි සාලයක් තිබ්බා... වහලේ උලු ... ගොම මැටි ගාපු බිම... කුප්පි ලාම්පුව... බැටරි දාන රේඩියෝ එක... මට හරි සමීපයි...

තාත්තට වහින දවසට වැඩ නෑ.. පොල් ගස් තෙමුනම නගින්න බෑනේ.. ගොඩක් වෙලාවට පොල් ගහක් නැග්ගම ගෙඩි දෙකක් වගේ ලැබෙනව... හයියෙන් වැස්සොත් අම්මටත් වැඩ නෑ... ඇඩි ආර්ථික ගැටලු මැද තමයි ජීවිතේ ගෙවුණේ..

මම ශිෂ්‍යත්වය ෆේල් ලකුණු 76 යි. තිබ්බේ. 11 වසරේ තමයි අමතර පංතියකට කියලා ගියේ.. එතකන්ම යන්න සල්ලි තිබ්බේ නෑ.. ඒත් අම්මා මාව ගනං පන්තියකට දැම්මා... මට මතක විදියට දවසට රුපියල් 40/- යි.

පංතියේ ඉගැන්නුවේ කැම්පස් යන ලස්සන සර් කෙනෙක්... සර් මම පරන කොලවල ලියනවා දැකලා මාත් එක්ක දවසක් ගොඩක් වෙලා කතා කලා... සර්ට මම හැමදේම වගේ කිව්වා.... පස්සේ සර් මට පංති 3ටම නොමිලේ යන්න අවස්ථාව හදලා දුන්නා... ඒ වගේම 10 වසර පංති වලටත් ගිහින් වැඩ ටික කරලා කොහොම හරි හොඳ ප්‍රතිපලයක් ගන්න කිව්වා...

මගේ ජීවිතේ වෙනස් වෙන්න ගත්තේ ඒ කාලේ...

මම ගොඩක් පාඩම් කළා... පොත් ගොඩක් කියෙව්වා... අපේ පුස්තකාලයේ තිබ්බ පොත් ඔක්කොම වගේ මම කියවලා තිබුණා. මට ටික ටික වැඩ පුලුවන් වුණා... කොහොම හරි මම පාසලේ පන්තියේ පලවෙනියා වුනා දෙවෙනි වාරෙ වෙද්දී අපේ පංතියේ ළමයි හිටියේ 28 යි

මම ඔහොම යන්තම් ගොඩ නැගීගෙන එද්දී තාත්තා පොල් ගහකින් වැටිලා.... තාත්තා එකතැන් වුණා.... මගේ ජීවිතේම කඩා වැටුනා වගේ වුණා...

මම තවත් හොඳට ඉගෙන ගන්න ඕන කියලා හිතලා හොඳටම වැඩ කළා... සමහර දවස් වල භූමිතෙල් ටික කුප්පියේ ඉවර වෙනකම්ම පාඩම් කළා... විභාගය ලියපු අක්ක කෙනෙක්ගෙන් පාස් පේපර්ස් ඉල්ලන් විෂයන් 9 ම කළා.... අවසානයේ මම ඒ 8 බී 1 යි ගත්තා... අදටත් ඒ පාසලේ හොඳම ප්‍රතිඵලය ඒක...

පස්සේ මම උසස් පෙළ කරන්න නගරයේ පාසලකට ආවා. අම්ම කොහොම හරි උගන්වන්නම් කිව්වා.. මට පොඩි ශිෂ්‍යත්ව වගයකුත් ලැබුණා. අම්මගේ මල්ලී ඒ අපේ මාමත් මට උදව් කරන්නම් කිව්වා. කොහොම හරි නගරයේ හොඳම පාසලට මාව ගත්තා..

දුප්පත් කියලා බැලුවේ පාසලට ආධාර එහෙම ඉල්ලුවා ගොඩක් ළමයි ලොකු ගනන් දීලා තමයි පාසලට ඇතුල් වුනේ.. ඉතිං අපිට කොයින්ද සල්ලි.... කොහොම හරි අපේ ප්‍රින්සිපල් සර් කතා කරලා ඒ ප්‍රශ්නේ විසඳුවා...

පාසලේ මට යහලුවෝ නැහැ... ගොඩක් වැදගත් පවුල් වල ළමයි හිටියේ... ගොඩක් ප්‍රසිද්ධ උදවියගේ ළමයි හිටියේ. මටම සෙට් වෙන මං වගේ ගමෙන් ආපු යාලුවෙක් හිටියා.. අපි දෙන්නා හොඳටම යාලු වුණා..

7 වෙනි පිටුවට...

6 වෙනි පිටුවෙන් ...

# අවසන් වසරේ වෛද්‍ය සිසුවියගේ කතාව......

අපි ගියේ එකම පංති වලට එකම ඩෙස් එකේ හිටියේ... එයා ඒ 9 ක් අරන් ආපු ළමයෙක්.. අපේ ගමට ගම් දෙකක් එහා ගමේ...

අපි පනදාගෙන වැඩ කළා... ඒත් පළමු වාර විභාගේ මම 36 යාලුවා 28 පංතියේ ලමයි 40 යි. අම්ම ආවා රැස්වීමට ලකුණු අහලා අම්මට හොඳටම අවුල් ගියා..

මට ඒක තේරුනා.. අම්ම ඒත් මට මුකුත් කිව්වේ නෑ... මට ගොඩක් දුක හිතුන දවසක් ඒක... මම හොඳටම වැඩ කරන්න හිතාගත්තා...

හොඳ ප්ලෑන් එකක් ගහලා වැඩකලා... හොඳටම කරගෙන ගියා... අපි දෙන්න හිටියේ එකම බෝඩිමේ... ගොඩක් දවස් වලට එළිවෙනකම් පාඩම් කලා..

සමහර දාට පාසල් ගියේ නෑ.. පුටුවෙන් නැගිටින්නේ බොහෝ විට කෑමට.. ටොයිලට් යන්න වගේ ඒවට විතරයි..

හොඳට වැඩ කරන් ආවා.. හැම විෂයකම අමතර පොත් කියවලා.. කෙටි සටහන් හදාගෙන ප්‍රශ්න පත්‍ර පොත් පිටින් කර කර වැඩ ටික හොඳට කරන් ආවා... එකම පොත 5 වතාවකට වඩා කරලා ඇති..

මේ අස්සේ යාලුවට හමුදාවේ අයිය කෙනෙක් පස්සෙන් ඇවිත් යාලු වෙලා එයා ජීවිතේම විනාස කරගත්තා... අන්තිමට යාලුවා ප්‍රෙග 'නන්ට් උනා... අවසානයේ ඔක්කොම දාලා එයා අර පිරිමි ළමයා එක්ක ගියා.. මම බෝඩිමේ තනි උනා..

මම විභාගය ලිව්වා.. ලියලා ගෙදර ආවා.. ඒ එද්දි අම්මා කටු ගැහිලා... ඇටසැකිල්ල විතරයි... තිබ්බේ.. අම්ම දවල් කුලියට ගිහින් රෑට දලු ෆැක්ටරියේ රැවැඩට ගිහින් එහෙමයි මට ඉගෙන ගන්න සල්ලි එවලා තිබ්බේ... අම්මා ඒ අවුරුදු 3ට දවසට පැය 3 ක් වත් නිදාගෙන නෑ මට දැනුන විදියට.

මම අම්මට ගෙදර ඉන්න කියලා ටවුමේ ගාමන්ට් එකට ගියා.. හම්බකරන හැම සතයක්ම ඉතුරු කරගත්තා... අම්මත් වැඩ නතර කලේ නැහැ... මම ප්‍රතිඵල එද්දී ලක්ෂයකට ආසන්න ගානක් එකතු කරන් තිබුනා සල්ලි... මම තව කජු එහෙමත් වගා කලා...

පස්සේ රිසල්ට් ආවා... බී 3 යි රැන්ක් එක 198... වෛද්‍ය විද්‍යාලයට ගත්තේ 76 යි.... කැම්පස් යන්න පුලුවන් .. මම හිතුවේ ඒ 3 කියලා...

මම ඉතුරු කරගත්තා සල්ලි වලින් පංති ගිහින් ආයිත් විභාගය කලා... මම ගාමන්ට් එකෙන් අයින් උනා.. ඒත් වගාව දිගටම කරන ගමන් වැඩ ටික කරන් ගියා... මම දෙවෙනි වර ලියලා ආයිත් ගාමන්ට් ගියා..

ප්‍රතිඵල ආවා ඒ 3 යි රැන්ක් එක 9... මම කැම්පස් එනතෙක්ම එක එක ජොබ් කලා.... ඉංග්‍රීසි ඉගෙන ගත්තා .. කැම්පස් ඇවිල්ලත් මම පංතියක සර් කෙනෙක්ගෙ පේපර් බලලා තමයි වියදමට සල්ලි හොයා ගත්තේ... තව පොඩි පොඩි ජොබ් කලා.. අදටත් කරනවා...

කොහොම හරි මම මගේ දුක් විඳපු කාලෙ අවසන් කරන්න ඔන්න මෙන්න ඉන්නේ...

මේ කතාවේ නොකියපු දුක් කම් කටොලු ඕනතරම් ඇති... නොකා ඉදපු දවස් නැති උනාට නොකා ඉදපු වේල් නම් ඕන තරම් තිබුනා..

බත් වලට ලුනු ඩිංගක් ඉහලා පොල් එක්ක කලවම් කරලා කාපු දවස් ඕන තරම් තිබුනා.. මට හොඳ යාලුවෝ කීප දෙනෙක් හිටියා ඔවුන් මට හැකි සෑම විටම උදව් කලා... අවසානයේ කියන්නේ ජීවිතේ දිනන්න මහන්සි වෙන්න... උත්සාහය තමයි වැදගත්ම ... එක අරමුණකින් වැඩ කරන්න.



Ceylon Shipping Lines Ltd.
Printing Department



CSL Printing is a fully fledged design printing department equipped with latest technology including Computer offset printing from concept to finished product, with the capacity and capability to undertake all types of commercial printing for local & overseas customers.

Ceylon Shipping Lines Ltd.,
Printing Department,
No. 758/3, Dr. Danister De Silva Mawatha,
Colombo 09.
Tel: 011 - 2683237 Fax: 011 - 2683238
E- mail: cslpri@sltnet.lk

Head Office:
Ceylon Shipping Lines Ltd.,
No. 450, D.R. Wijewardana Mawatha,
Colombo 10.
Tel: 011 - 2689500 - 8


CEYLON SHIPPING LINES
TRAVELS & TOURS
Tel : +94 11 2689500 - 8
Fax : +94 11 2689510
E-mail : csltravels@sltnet.lk
Skype : csltravels
For more details, please click the below link
IATA
ACCREDITED AGENT



# ලෝ වටා රෑ රටා මැව් කොටා උඩවලවේ කොටා

**කුරු අලින් පිළිබඳව වාර්තාවුවද කුරු අලියෙකු දැක ගැනීමට හැකියාවක් ලැබී නැත. සත්ව හා පරිසරවේදීන් අලින්ගේ දිරාගිය අස්ථි පරීක්ෂා කර කුරු අලින් විසූ බවට නිරීක්ෂණය කළද එවැන්නෙකු සජීවීව දැක ගැනීමට වරම් ලබා නැත. එහෙත් මුල් වරට 2013 දී උඩවලවේ ජාතික වනෝද්‍යානයේ අටවා තිබූ කැමරාවල කුරු අලියෙකු සිය ජායාරූපය රඳවා ගොස් තිබුණි. ඒ අනුව මෙම සද්ධන්තයා හඳුනා ගැනීමට පරිසරවේදීන්ට හැකියාව ලැබුණි.**

තවත් විටෙක කුරු ඇතින්නියක්ද කැමරා වල සටහන් වී තිබුණද පියවි ඇසින් දැක ගැනීමට තාමත් හැකියාව ලැබී නැත.

සද්ධන්ත කුලයක සාමාජිකයෙකු වුවත් මොහුගේ කඳ බඩ මහතට තිබුණත් දෙපා කොට නිසා වලවේ කොටා යැයි ඉබේම ජනවහරට එක් වී ඇත. ආසියාව තුළ සජීවීව දැක ගත හැකි එකම කුරු අලියා මොහු බැවින් වැඩි දෙනෙකුගේ අවධානයට ලක්වී ඇත.

පළමුවෙන්ම 2013 වසරේදී අලි පර්යේෂණ ව්‍යාපෘතියේ සමීර වීරතුංග මහතා ගේ කැමරා උගුලේ මේ වලවේ කොටා කාච ගත වූ පසු දිගින් දිගට මොහු සොයා ඇවිද ගිය පිරිසට කොටා හමුවිය. මොහුගේ ජායාරූප ප්‍රසිද්ධියට පත් කළ පසු ලොවපුරා අවධානය යොමු වූ අතර දෙස් විදෙස් සංචාරකයින් වලවේ කොටා සොයා මෙහි පැමිණියහ.

අනතුරුව හැම වසරකටම මැයි ජූනි ජූලි මාසවල මෙම ප්‍රදේශයේදී කොටා මුන ගැසුනද 2019 වසරේදී මුණ ගැසී නැත. ව්‍යාපෘති පර්යේෂකයින් එම ප්‍රදේශය පුරා කැමරා උගුල් සවි කරමින් මත්තල, අන්දර වැව, මීගහපදුර, කුමරගම, මීග්සවැව, දෙමෝදර, තල්කටුවකන්ද ආදී සීමාවෙන් එපිට ප්‍රදේශත් ඒ ආශ්‍රිත වැසියනුත් සහභාගි කරගන වලවේ කොටා සෙවීමේ මෙහෙයුමක් දියත් කළහ. ප්‍රදේශවාසීන්ගේ සහාය මොවුන්ට නොවඩුව ලැබුණි.

මේ අතර දිනක් ගම්වාසීන්ගෙන් හෝඩුවාවක් ලැබුණි. "ඔය කියන විදිහේ කුරු අලියෙක් ගම් වැදිලා හිටියා". ව්‍යාපෘති පිරිස එම ප්‍රදේශයම වටලා කැමරා කාච සවිකළේය. එවිට සිතා ගන්නවත් බැරි දසුනක් රූප ගත වී තිබුණි. ඒ කුරු ඇතින්නියකි. ඒ කුරු ඇතින්නියගේ පිංතූරය දුටුවත් සතා සජීවීව දැක නැත. මෙම කුරු කෙනර ගිය ප්‍රදේශය සොයා යන විට කොටා පිරිසට හමුවිය. ඒත් ඇත්තටම ඔහු සිටියේ වනජීවී ප්‍රදේශ හැටියට ගැසට් කර නැති ප්‍රදේශයකයි. අලියාට අපේ නීති ගැසට් අදාළ නොවේ. ඌට හරියන පරිසරය ඌට අයිතිය. අලියා සිතන්නේ එලෙසය.

ජීවමානව නොදුටුවත් ස්ථිර වශයෙන්ම කුරු කෙනරක් ද මෙහි සිටියි. ලොව කිසිම තැනක ජීවමානව මෙවැනි සතෙකු දැක ගැනීමට නොහැක. ලොව නන් දෙසින් දහස් ගනන් සත්ව හිතකාමීන් මොවුන් දැකීමට මෙහි පැමිණෙති. එයින් රටට දහස් ගනන් මුදල් ලැබෙති.

පසුගිය කොරෝනා සමයේ උඩවලව වසා තිබුණි. එය විවෘත කර දින දෙකකට පසු එහි සිටින සෆාරි රියැදුරෙකු වූ හිරූෂ හංසක උඩවලවට ඇතුළු විය. ඒ ජූනි 17 වැනිදාය. එහිදී ඔහු කොටා දැක ඇත. කොටා ගේ ජායාරූප කීපයක්ද ගෙන ඇත. උගේ ඇගේ වෙඩි වැදුනු තුවාල දක්නට ලැබුනු බව හංසක කියයි. එයින් අදහස් වන්නේ වලවේ කොටාගේ ජීවිතය අනතුරට වැටී ඇති බවයි.

එහෙම වුනොත් මේ ලෝකෙටම පාඩුවකි. සියලු බලධාරීන් මේ ගැන අවධානය යොමුකළ යුතුය. එපමණක්ද නොව මිනිසුන්ද මිනිස් ගති වැඩි දියුණු කරගෙන මෙවැනි විනාශයන් සිදු නොකිරීමට කටයුතු කළ යුතුය.



# මන්ත්‍රී හිමිකම්

රටේ ඉදිරි පාලන කටයුතු සඳහා අවශය නීති රීති සම්පාදනය සඳහා අවශ්‍ය මන්ත්‍රී සංඛ්‍යාව වූ 225 දෙනා තෝරා පත්කර ගැනීමේ පාර්ලිමේන්තු මැතිවරණය පසු ගියදා පැවැත්විණි. ඒ මන්ත්‍රීවරු අතරින් අමාත්‍යවරුන් 25 ක් හා රාජ්‍ය අමාත්‍යවරුන් 9 දෙනෙක් ජනාධිපතිවරයා විසින් තෝරා පත්කර ගන්නා ලදී.

ඉදිරි වසර 5 ක් සඳහා රටේ භාරකාරත්වය මෙම අමාත්‍ය මණ්ඩලය ජනාධිපති හා පාර්ලිමේන්තුව විසින් දරාගත යුතුය. මෙම කාලය තුළ රට තුළ සිදුවන හොඳ හෝ නරක කුමක් හෝ සිදුවේද එසේත් නැත්නම් ගනු ලබන තීන්දු තීරණ වලින් රටට අනාගතයේ හොඳක් හෝ නරකක් සිදුවේද ඒ සඳහා මෙම පිරිස වගකිව යුතුය. එයින් බැහැර වීමට කිසිවෙකුට අයිතියක් නැත.

එහෙත් බොහෝ විට සිදුවන්නේ හොඳ දෙයක් සිදුවූ විට එහි අයිතිය ගැනීමේ පිරිස වැඩිය නරකක් සිදුවුවහොත් එහි වගකීම භාරගැනීමට කිසිවෙකු නොමැති කමයි.

විශේෂයෙන් රාජ්‍ය පාලනයේ වගකීම ජනාධිපති අගමැති අමාත්‍ය මණ්ඩලය දැරිය යුතුය. අමාත්‍යවරු 25 ක් හා රාජ්‍ය අමාත්‍යවරු 39 ක් මේ වන විට පත්වී ඇත.

මන්ත්‍රීවරයෙකු වීමට ඒ ඒ අපේක්ෂකයින් දරන වෙහෙස කොතෙක් දැයි අපේ ජනතාවට අමුතුවෙන් කිව යුතු නොවේ. ඒ සඳහා වැය කරන කාලය වැය කරන මුදල් ප්‍රමාණය අති විශාලය. කෙසේ හෝ මන්ත්‍රී වූ පසු ඊළඟට දගලන්නේ ඇමති හෝ උප ඇමති ධූරයක් සඳහාය. පසුගිය කාලවල කිරීමට නියමු වැඩ කොටසක් නැතත් ඇමති තනතුරක් ලබා සිටි පිරිස්ද සිටියහ.

මෙසේ මේ තනතුරුවලට දගලන්නේ රටට වැඩක් කිරීමටත් වඩා ලැබෙන වරප්‍රසාද ලබා ගැනීම සඳහාය. නියම හා අනියම් වශයෙන් ලැබෙන වරප්‍රසාද ද ඇත.

මන්ත්‍රීවරයෙකුගේ වැටුප රු. 54285 කි. නි. ඇමතිවරයෙකුට රු. 63,500 කි. කැබිනට් ඇමතිවරයෙකුට රු. 65,000 ක් වන අතර කතානායක වැටුප රු. 68,500 කි. අගමැති වැටුප රු. 71,500 ක් වන අතර කාර්යාල හා ප්‍රවාහන දීමනා වශයෙන් රුපියල් ලක්ෂය බැගින් හිමි වේ.

මන්ත්‍රී කෙනෙකුගේ දුරකථන දීමනාව මසකට රුපියල් 50,00 කි. කාර්යාල දුරකථන දීමනාව ස්ථාවර හා ජංගම වශයෙන් තවත් රු. 50,000 කි. තැපැල් ගාස්තු වශයෙන් වසරකට රු. 350,000 නිදහස් තැපැල් සේවයක් ලැබේ. රියැදුරු හා සංග්‍රහ දීමනා වශයෙන් රු. 45000 ක් ලැබෙන අතර පාර්ලිමේන්තු රැස්වීමකට සහභාගි වූ විට එම දිනයට රු. 2500 ක දීමනාවක් ලැබෙන අතර පාර්ලිමේන්තු රැස්වීම නොමැති දිනක කාරක සභා රැස්වීමකට පැමිණිය ද එම දීමනාව එසේම ලැබේ.

මන්ත්‍රීවරයා ගේ සම්බන්ධීකරණ ලේකම්වරයාට පෙට්රල් දීමනාව වශයෙන් ලීටර් 218 ක් වෙනුවෙන් රු. 17440 ක් ලැබේ. මන්ත්‍රී කාර්ය මණ්ඩලයේ ඉහළ තනතුරු සඳහා හිමි වැටුප රු. 30000 කි. එයට ඉන්ධන හා දුරකථන දීමනාව ඇතුළත්ය. අමාත්‍ය කාර්ය මණ්ඩලය සඳහා වාහන 5 ක් හිමි වන අතර නියෝජ්‍ය අමාත්‍ය කාර්ය මණ්ඩලයට වාහන 03 ක් ලැබේ.

මන්ත්‍රීවරුන්ට හා අමාත්‍යවරුන් සඳහා සුඛෝපභෝගී වාහන ලබාගැනීම සඳහා තීරුබදු රහිත වාහන බලපත්‍රයක් හිමි වෙයි. මන්ත්‍රීවරයෙකු හදිසි මරණයකට පත්වුවහොත් ගෙවන වන්දි මුදල රුපියල් ලක්ෂ 50 කි. ඊට අමතරව හිමි වන රක්ෂණය රු. ලක්ෂ 20 කි. සුඛෝපභෝගී නිල නිවසක් සහ සුපිරි කෑම වේලක් රු 150 ක ට පාර්ලිමේන්තුවේදී ලැබෙයි.

සිය දරුවන් සුපිරි පාසැල්වලට ඇතුළත් කර ගැනීමේ වරප්‍රසාදයක් ද හිමි වන අතර විදේශ සංචාර ඒ සඳහා දීමනා ද ලැබෙන අතර විදේශවලදී තරු පංතියේ හෝටල්වල නවාතැන්ද හිමි වෙයි. මන්ත්‍රීධූර කාලය වසර 5 ක් සම්පූර්ණ කළ විට විශ්‍රාම වැටුපක්ද හිමි වෙයි.

පොදු ජනතාවට සේවය කිරීම සඳහා පැමිණෙන මේ පිරිස ලබන මේ වරප්‍රසාද සියල්ල සඳහා වියදම් දරන්නේ මේ රටේ ජනතාව ගේ පොදු බදු මුදල්ය. මෙම මන්ත්‍රීවරුන් සඳහා මේසා විශාල වරප්‍රසාද හිමි වූයේ 1977 න් පසුවය. එතෙක් එතරම් වරප්‍රසාද ප්‍රමාණයක් හිමි වූයේ නැත.

1977 දක්වා මන්ත්‍රීවරයෙකු සඳහා මාසික දීමනාවක් ලබා දුන් අතර 77 බලයට පත්වූ එ.ජා.ප. රජය මන්ත්‍රීවරුන්ගේ පැමිණීම දිරිමත් කිරීම උදෙසා පාර්ලිමේන්තු පැමිණෙන දිනකට රු. 100 ක දීමනාවක් මාසික දීමනාවට අමතර ගෙව්වේය. එදා ඒ රු. 100 අද 2500 දක්වා වැඩි වී ඇත.

එකල කොළඹට සැතපුම් 50 ට වඩා දුරින් සිටින මන්ත්‍රීවරුන් සඳහා නවාතැන් ගාස්තු වශයෙන් දිනකට රු. 50 ක් ගෙවූ අතර මන්ත්‍රීවරුන්ගේ නවාතැන් සඳහා ශ්‍රාවස්තිය වෙන් කළ පසු එම දීමනාව අත් හිටුවන ලදී. 77 ට පෙර මන්ත්‍රීවරුන් සඳහා ප්‍රවාහන පහසුකම් සඳහා දුම්රිය ප්‍රවේශපත්‍රයක් ලබා දී තිබුණි. වරක් හබරාදූව හිටපු මන්ත්‍රී ඩී. එස්. ගුණසේකර මන්ත්‍රීවරයාට දුම්රිය බලපත්‍රය නොතිබීම හේතුවෙන් දඩ කෑමට ද සිදුවිය.

මන්ත්‍රී විශ්‍රාම වැටුප හිමි වූයේ 1977 න් පසුවය. 1977 අංක 1 දරණ පනතින් එය අනුමත වූ අතර බිරිඳ හෝ සැමියා හෝ දරුවන්ට එය උරුම වූයේ නැත. අනතුරුව 1990 දී අංක 47 දරන පණතින් එය සිය කාලත්‍රයාට දහ අටට අඩු දරුවන්ට හා ආබාධිත දරුවන්ට එම වරප්‍රසාදය හිමි විය. මන්ත්‍රී වැටුපෙන් තුනෙන් එකක් විශ්‍රාම වැටුප වශයෙන් හිමි වෙයි.

**මන්ත්‍රීවරයෙකුගේ වැටුප රු. 54285 කි. නි. ඇමතිවරයෙකුට රු. 63,500 කි. කැබිනට් ඇමති වරයෙකුට රු. 65,000 ක් වන අතර කතානායක වැටුප රු. 68,500 කි. අගමැති වැටුප රු. 71,500 ක් වන අතර කාර්යාල හා ප්‍රවාහන දීමනා වශයෙන් රුපියල් ලක්ෂය බැගින් හිමි වේ.**

යම් මන්ත්‍රීවරයෙකු වසර 5 ට වඩා වැඩි වසර 15 ට නොවඩු කාලයක් මන්ත්‍රී ධූරය දරා ඇතිනම් ඔහුට තම වැටුපෙන් තුනෙන් දෙකක් හිමි වෙයි. ඊටත් අමතරව රු. 3500 ක් රු. 10,000, 15,000 වශයෙන් අන්තර් දීමනා තුනක් ද එයට ඇතුළත් වේ.

1977 න් පසු හිමි වූ තවත් වරප්‍රසාදයක් වූයේ වාහන ගෙන්වීමේ බලපත්‍රයයි. එතෙක් මන්ත්‍රීවරුන් තමන්ගේ පුද්ගලික වාහනවලින් හෝ නිළ රථ පමණක් භාවිතා කළේය. 1982 දක්වාම මන්ත්‍රීවරයෙකුට ලැබුණු මාසික දීමනාව රු. 1000 ක් හා ඉන්ධන දීමනාව රු. 7500 ක් සංග්‍රහ දීමනා රු. 1000 ක් දුරකථන බිල රු. 2000 ක් හිමිය. පාර්ලිමේන්තු රැස්වීම් සඳහා පැමිණීමේදී දිනකට රු. 500 ක් ගෙවා ඇත.

මන්ත්‍රී කාර්ය මණ්ඩලයට 3 දෙනෙකු ඇතුළත් කරගත හැකි විය. ඒ සඳහා වැටුප එක් අයෙකුට රු. 1000 කි. අමාත්‍යවරයෙක් සඳහා පෞද්ගලික ලේකම් පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ ලේකම් මහජන සම්බන්ධතා නිළධාරී, සහකාර ලේකම් (මාධ්‍ය) ලිපිකරු හා රියැදුරු වශයෙන් හය දෙනෙකි. 1982 හා 2004 අතර වසර 22 තුළ එකවර 95% කින් එම දීමනා ඉහළ ගොස් ඇත.


2004 වනතුරු මන්ත්‍රීවරයෙකු ගේ උදේ කෑම සඳහා රු. 6.00 ක් හා දහවල් කෑම සඳහා රු. 15 ක් තිබූ අතර එය 2004 දී උදේ කෑම සඳහා රු. 60 ක් හා දහවල් කෑම සඳහා රු. 150 ක් දක්වා ඉහළ දැම්මේය.

මන්ත්‍රී වැටුප හෝ ඇමති වැටුප හා ඔවුන් ගේ වරප්‍රසාද ගැන ජනතාවට මැසිවිල්ලක් ඇත්තේ ඔවුන් කෙරෙහි ඊර්ෂ්‍යාවකින් නොවේ. ඔවුන් ලබන වරප්‍රසාද වලට සාපේක්ෂව ජනතාවට සේවයක් වන්නේද යන්න පමණි. ඔවුන් ගෙන් පැහැදිළි සේවාවක් ජනතාවට සිදුවන්නේ නම් ඔවුන්ගේ වරප්‍රසාද ගැන ජනතාව මැසිවිලි නගන්නේ නැත.

70 හා 77 අතර හිටපු ඇමතිවරයෙකු වන ඇන් ඇම් පෙරේරා මහතා මන්ත්‍රී ඇමති වරප්‍රසාද වැඩි නොකිරීම වෙනුවෙන් දැඩිව අරගල කළද ඉන්පසු බිහි වූ සියලු දෙනා එම වරප්‍රසාද ඉහළ දැමූ අන පනත්වලදී ඒකමතිකව සම්මත කොට ඇත. ජනතා ප්‍රශ්නවලදී කොයි අතකට ඔවුන් බෙදුනත් ඔවුන් ගේ දීමනා හා වරප්‍රසාද ලබා ගැනීමේදී එක හඩින් එයට අත උස්සා ඇත.








# දෙමෝදර රේල් ගැටේ...

**ලංකාවේ සංචාරකයින් පමණක් නොව දේශ දේශාන්තර වල සංචාරකයින් පවා මෙම දුර්ලභ ස්ථානය දැක ගැනීමට කැමැත්තක් දක්වති. මෙහි ඇති විශේෂත්වය නම් අප ගමන්ගන්නා රේල් පාර කන්දක් වටින් කැරකවී ගොස් රේල් පාරට යමින් මතුවී ගමන් කළ දිසාවටම ගමන් කරයි.**



ලංකාවේ සිදුකරන සංචාර අතර දුම්රියේ බදුල්ල දක්වා ගමන්කිරීම අතිශය විනෝදකාරී සුන්දර ගමනකි. කිලෝමීටර් දෙකෙන් තුනෙන් වෙනස්වන පරිසර රටාවකින් යුත් මෙම ගමනට බොහෝ දෙනෙකු ප්‍රිය උපදවයි. ඇකුම්කළු වටපිටාවක් සහිත ගමනක් වන මෙම මාර්ගයේ කි.මී. 277 - 814 අතර ගමනේදී විශ්මය දනවන රේල් ගැටයක් හමුවෙයි. මෙය දුම්රියේ ගමන් කරන අයෙකුට දැනෙන්නේ නැත. දෙමෝදර දුම්රිය ස්ථානයේ බැස වටපිටාව නිරීක්ෂණය කරන්නෙකුට පමණක් මෙම රේල් ගැටය දැක ගතහැක.

ලංකාවේ සංචාරකයින් පමණක් නොව දේශ දේශාන්තර වල සංචාරකයින් පවා මෙම දුර්ලභ ස්ථානය දැක ගැනීමට කැමැත්තක් දක්වති. මෙහි ඇති විශේෂත්වය නම් අප ගමන්ගන්නා රේල් පාර කන්දක් වටින් කැරකවී ගොස් රේල් පාරට යමින් මතුවී ගමන් කළ දිසාවටම ගමන් කරයි.

එවකට ඉංග්‍රීසි ආණ්ඩුව කන්ද උඩරටට දුම්රිය මාර්ගය තැනුවේ උඩරට වැවිලි භෝග කොළඹට ගෙන ඒම සඳහාය. එම ආණ්ඩුව මුදල් හා තාක්ෂණය යෙදුවේ නමුත් ඒ සඳහා දහඩිය ලේ කඳුළු සැලුවේ අපේම ආදිමතුන්ය. අද තරම් දියුණු තාක්ෂණයක් නොතිබුණු ඒ යුගයේ වැඩිම වැඩ කොටසක් ඉටුවූයේ මිනිස් ශ්‍රමයෙනි. ඒ නිසා වැය වූ කාලය ධනය ශ්‍රමය අධිකය. අනන්තවත් මිනිසුන් දහදුක් විඳින්නට ඇත. ඔවුන්ට නිසි වැටුපක් ලැබුණේද නැත. එවකට එම ආණ්ඩුව ඇග බද්ද බලු බද්ද ආදී වශයෙන් බදු ක්‍රම දියත් කළේය. ඇග බද්ද යටතේ නොමිලේ රජයට වැඩ කළ යුතුය.

කි.මී. 277 පසු කරද්දී ඉදිරියට ඇත්තේ විශාල පාතාලයකි. එතනින් පහළට රේල්පාර ගත නොහැක. එසේ ක්ෂණිකව පහළට ඇදෙන රේල්පාරක දුම්රියක් ධාවනය කළ නොහැකිය.

මේ සඳහා ඔවුන් විවිධ උපාය මාර්ග කල්පනා කළහ. ජනප්‍රවාදයට අනුව ගවයින් බලාගත් ගොපලුවෙකු මාර්ග ඉංජිනේරුවරයාට හිසේ පැළඳි ජටාව පෙන්වූ බව කියයි. එම ජටාවේ පොටවල් දෙක එකට එකක් උඩින් ඇති අයුරු පෙන්නූ පසු කන්ද වට කැරකවී උමගක් දිගේ එම පැමිණි මාර්ගයට යටින් දුම්රිය මාර්ගය තැනූ බව කියයි.

මෙම ප්‍රදේශයේදී දුම්රිය මාර්ගය ඉහළට ඇදී යන්නේ අඩි 44 ට අඩි එකක් ලෙසිනි. අඩි 44 ක් ඉදිරියට ඇදෙන විට අඩියක් රේල්පාර ඉස්සෙයි.


කෙසේ නමුත් දෙමෝදර රේල් ගැටය පිළිබඳ ජනප්‍රවාදයක් තුළින් අපේ අයෙකුගේ නිර්මානයක් යැයි පැවසුවද මෙවැනිම රේල් ගැට තුනක් ඉන්දියාවේද දැකිය හැකිය. ඉන්දියාවේ ඩාර්ජිලින් හිමාලයානු දුම්රිය මාර්ගයේ මෙවැනි රේල් ගැට පහක් තිබී ඇති අතර දැන් එය තුන දක්වා අඩුකර ඇතැයි පවසයි.

එම මාර්ගය විවෘත්ත කර ඇත්තේ 1881 දීය. 1921 විවෘත්ත කළ අගෝනි පොයින්ට් (Agorny Point) යන ස්ථානයේද දක්නට ලැබෙයි.

කෙසේ නමුත් මෙය අලංකාර දසුනකි. මෙය මැනවින් දැක ගැනීමට නම් පළමුව දෙමෝදර දුම්රිය ස්ථානයට ගොස් ඒ පිටුපස ඇති කඳුගැටය මත නැගී ඊළඟ දුම්රියක් පැමිණෙන තෙක් බලා සිටිය යුතුය. එවිට එම මනරම් දසුන දැක ගත හැකි පමණක් නොවේ සිදුකර ඇති දේද අවබෝධ කරගත හැක.




SPECIAL OFFER



# ELLA TOUR

**LKR 8,500 PER PERSON PER NIGHT**





- Minimum 10 pax
- Conditions apply offer valid till end of October 2020

## Package Including:

- Hotel accomadation on full board basis
- Nine Arches Bridge Tour
- Little Adam's peak Hiking
- Ravana Falls
- Colombo to hotel return transfer on A/C vehicle

Please Contact us for further details,
Eranga - 0772672970
Lakmali - 0773572835
Roshadi - 0773561210

Ceylon Shipping Lines Travels,
No. 450, D.R. Wijewardana Mawatha,
Colombo 10.
Tel: 011 - 2689500 - 8

CSL TRAVELS

# 40+ පසු මේ ගැනත් සිතන්න.

ඕනෑම කෙනෙක්ගේ ජීවිතයේ ස්වර්ණමය දශකය 40-50 අතර කාලය අවුරුදු 40 න් පස්සේ ජීවිතේ දශක 4 ක් ඉවරයි. ආයුෂ අවුරුදු 80 ක් කියලා හිතුවොත් ජීවිත කාලයෙන් භාගයක්ම ගත කරලා ඉවරයි. දැන් තියෙන්නේ ඉතින් යන තැනකට වැඩක් කරගන්න එක. ඔහොම තමයි ලංකාවේ අපි හිතන්නේ ඒත් බටහිර රටවල ඔය කතාව හාත්පසින්ම වෙනස්. එයාල ජීවිතේ පටන් ගන්නේ 40 න් පස්සේ දරුවෝ දීග දීලා ලාමක අස්ථාවර සිතුවිලි වලින් මිදිලා මිනිසුන් හඳුනාගෙන ජීවිතේ පරිපූර්ණ වෙච්චි කාලයක් මේක. ඉතින් ඒ කාලේ ජීවිතේ විඳින්න පුළුවන් කාලේ කිව්වොත් හරි. බුද්ධිමත් කාන්තාව ඉතින් සියලුම ප්‍රශ්න මැද නිරෝගී ජීවිතයක් ගත කරනවා. එයාල මෙන්න මෙහෙම සාමාන්‍ය දේවල් ටිකක් කරනවා.

* නිසි ශාරීරික ව්‍යායාම
* සමබල ආහාර වේල
* හානිදායක ආහාර වලින් සම්පූර්ණයෙන් නිදහස් වීම
* පිටි කෑම 60% කින් පාලනය
* ක්ෂණික කෑම සම්පූර්ණයෙන් අත හැරීම
* හද අව්වට නිරාවරණය නොවී සිටීම
* අධික මානසික ආතතියෙන් යුතු බැඳීම් වලින් ඉවත්වීම
* කල්පනාකිරීම 50% න් අඩු කිරීම
* ක්‍රියාකාරකම් වල නිරත වීම



**ඒ වගේම පහත උපදෙස් වැඩියෙන් අනුගමනය කරන්න.**

★ කාන්තාවක අවශ්‍ය විටමින් සහ ෆෝලික් අඩංගු බහුකාර්ය පෙත්තක් පාවිච්චි කිරීම.

★ ඔබේ මානසික පීඩනය ස්ට්රෙස් එක වැඩිනම් වහාම ඔබේ වෛද්‍යවරයා හමුවන්න.

★ අවුරුදු 40 පසු කෙනෙක්ගේ අස්ථි දිරාපත් වෙන්න පටන් ගන්නවා ආතරයිටිස් වැනි රෝග ඇතිවෙන්නේ එහෙම. එම නිසා කැල්සියම් මිලි ග්‍රෑම් 100 සහ විටමින් D දිනපතා ශරීරයට ලබාගන්න. මේවා පෙති වශයෙන්ම නොව හාල්මැස්සන් වැනි කුඩා මසුන්, අලුත් එළවලු මුහුදු මාලු වැනි දේවලින් ලබාගත හැකිය.

★ මාස තුනකට වරක් රුධිරගත සීනි, කොලෙස්ටරෝල් පරීක්ෂා කරගන්න. මෙයට සාමාන්‍ය වෛද්‍යවරයෙක් නොව ප්‍රසව හා නාරි හෙවත් VOG වෛද්‍යවරයෙක් හමුවන්න.

★ දිනපතා ආහාර ගැනීමට පසු හොඳ ඉදුණු කෙසෙල් ගෙඩියක් කන්න. මෙය බඩවැල් වල සංකුලතාවන්ට මෙන්ම මලබද්ධයටත් ඉතාම හොඳයි.

★ දිනපතාම කොල ඇපල් ගෙඩියක් කන්න. “ඇපල් ගෙඩියක් කන්න.. දොස්තරව ඈතින් තියන්න..” මේ කියමන නිකම්ම කියන දෙයක් නෙවෙයි. ඒතරම් කොළ ඇපල් ගුණයි.

★ ඔබේ දෑස් ඔබේ දෑස් මෙන් රැකගන්න. දිගින් දිගටම ගෑස් ලිප් පාවිච්චිය. ජංගම දුරකථනය පරිගණකය පාවිච්චිය, නිදිවැරීම, වැනි බොහෝ හේතු නිසා එය කෙලින්ම බලපාන්නේ අපේ ඇස් වලට. මේ නිසා අවුරුදු 40 න් පසු ඇස් දෙක පරික්ෂා කරගන්න. (දැන් ඉතින් පොඩි ළමයින් පවා කණ්නාඩි දානවා) අනිවාර්යෙන්ම කියවීමේදී රීඩින් ග්ලාස් පාවිච්චි කරන්න.

★ ජීවිතය අවට ලෝකය දෙස ඉරිසියාව කුහක කමින් බැලීමෙන් වලකින්න. සෞම්‍ය ලෙස ජීවිතේ දෙස බලන්න පටන් ගන්න.

★ බත් කනවිට රතුලූනු ගෙඩියක් හපලා කන්න. අවුරුදු 40 න් පස්සේ මේක කළයුතුමයි. රතුලූනු ශරීරය විෂෙන් තොර කලපයක් කරනවා.

★ උදෑසන සීනි නොදා දොඩම් යුෂ වීදුරුවක් බොන්න. එය ඔබේ පෙනුම රැකගන්න වැදගත්. ගැස්ට්‍රයිටිස් රෝගය ඇත්නම් පමණක් වෛද්‍ය උපදෙස් ඇතිව බොන්න.

★ නින්දට පෙර දෙහි යුෂ දැමූ උනුවතුර කෝප්පයක් පානය කරන්න. එය දවසේ අධික නොසන්සුන් බවත් තෙල් කෑමවල අධික කොලෙස්ටරෝල් ප්‍රමාණයත් පාලනය කරයි.

★ ඔලිව් ඔයිල් ආහාරයට ගන්න. ලෝක සෞඛ්‍ය සංවිධානය කියන විදියට ඔලිව් ඔයිල් ලෝකයේ තියෙන සුපිරිම ආහාරය. එහි ඇති හිතකර කොලෙස්ටරෝල් ශරීරයේ අහිතකර තෙල්වලට එරෙහිව සටන් කරනවා. තරුණ පෙනුම දෙනවා. ගන්නා විට එක්ස්ට්‍රා වර්ජින් ඔලිව් ඔයිල්” කියා ඉල්ලන්න.

★ කිරිපිටි නවතා දමා දියර කිරි බොන්න. ලංකාව වගේ දුප්පත් රටවල් පමණයි කිරිපිටි බොන්නේ. කිරිපිටි නිෂ්පාදනයේදී අධික විකිරණ ප්‍රමාණයක් යොදාගන්නවා. ඒ දියර කිරි බොන්න. එක වීදුරුවක් දවසටම ඇති පුලුවන්නම් සීනි නොදා බොන්න.

අද ඔබට මේ ලිපිය අදාළ නොවිය හැක. නමුත් ජීවිතයේ කවදාම හෝ අවශ්‍ය බව දැනගෙන කියවන්න. මෙහි ඇති බොහෝ දේ ඔබ දැන් සිට වුවද කිරීමෙන් ඔබට වරදක් සිදුවන්නේ නැත.

*උපදෙස්, පෝෂනවේදිනී හා කායික රෝග වෛද්‍ය නාලිකා වරකාගොඩ.*






# වුහාන් මකර කටින් අපේ දරුවන් ගෙන ආ හැටි







අද ලෝකයම භීතියට පත්කර ඇති කොරෝනා වසංගතයේ තිඹිරිගෙය වූයේ චීනයේ වුහාන් නගරයයි. වුහාන් නගරයේ එක් තැනකින් පටන් ගත් කොරෝනා වසංගතය නගරය පුරා දවසින් දෙකෙන් ව්‍යාප්ත වන්නට විය. ව්‍යාප්තිය පාලනය කරගත නොහැකි වූ චීන රජය වහාම නගරය වසා දැම්මේය. නගරයට ඇතුළුවීමට හෝ පිටවීමට කිසිඳු අවසරයක් නොවීය. සුන්දර මෙන්ම අලංකාර නගරයක් වූ වූහාන් වල ඒ වන විට විදේශිකයින්ද රැසක් සිටියහ. මේ පිරිස අතර ශ්‍රී ලාංකික ළමුන් 33 ක් විය. ඔවුන් ඒ රටේ අධ්‍යාපනය සඳහා ලංකාවෙන් ගිය පිරිස්ය. මොවුන්ද තම තමන් සිටි නිවෙස් වල සිරවිය.

මෙම කාලය චීන අලුත් අවුරුදු සමය බැවින් ඔවුන් ළඟ යම් ආහාර ප්‍රමානයක් සංචිතව තිබුණි. ජනවාරි 21 වන දින නගරය වසා දැමූ අතර දිනෙන් දින මරණ සංඛ්‍යාව ඉහළ ගියේය. ඔවුන් ගේ දෙමාපියන් ලංකාවේය. ඒ අය දැඩි බියෙන් ශෝකයෙන් තැති ගෙන සිටියහ. ළමුන්ද අවිනිශ්චිත තත්වයකට පත්වූහ. කඩ සාප්පු කාර්යාල ගුවන් තොටුපල මේ සියල්ල වසා දමා පාලු ස්වභාවයට පත්විය.

ශ්‍රී ලංකාව තරමටම විශාල වූ නගරයක් වූ වුහාන්වලට කොටු වූ ශ්‍රී ලාංකික සරසවි සිසුන් එතැන් පටන් තමන් සිටි කාමර හා නිවෙස් වලින් එළියට වත් නොපැමිණියේ දිනෙන් දින මරණ සංඛ්‍යාව හා රෝගීන් සංඛ්‍යාව ඉහළ යන්නට වූ නිසාය.

ජනපති ගෝඨාභය රාජපක්ෂ චීන රජය සමග සාකච්ඡා පවත්වන අතර බීජිං හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ වැඩ බලන සභාපති කේ. යෝගනාදන් හමුදා සම්බන්ධීකරණ නිලධාරී බ්‍රිගේඩියර් කල්ප සංජීව ඇතුළු කාර්ය මණ්ඩලය "වී චැට්" තාක්ෂණය ඔස්සේ සිසුන් හා සම්බන්ධ වෙමින් සියලු කටයුතු සම්බන්ධීකරණය කළහ.

මේ අතරේ ඇමරිකාව හා ජපානය චීන රජයේ අනුමැතිය මත තම ගුවන් යානා වුහාන් වෙත ගොඩබස්සවා තම රටවල සිසු සිසුවියන් සියල්ල මුදාගෙන ගියහ. ශ්‍රී ලංකා රජයත් ඒ ආකාරයෙන්ම සාකච්ජා පැවැත්වූයේ එම සිසුන් වුහාන් නගරයෙන් රැගෙන ඒමටය. ජනාධිපතිවරයාගේ උපදෙස් මත එම සිසුන් මෙරටට ගෙන ඒමෙන් පසුව නිරෝධායනය කිරීමට දියතලාව යුද හමුදා රෝහලේ වෙනමම වාට්ටු සංකීර්ණයක් සූදානම් කෙරුණේ යුද හමුදාපති ලුතිනන් ජනරාල් ශවේන්ද්‍ර සිල්වාගේ නායකත්වයෙනි. නේවාසික පහසුකම් ද ඇතිව පැය හැත්තෑදෙකක් තුළ දියතලාව යුද හමුදා ඇකඩමියට යාබද රෝහලේ සියලු දේ සූදානම් කිරීමට යුද හමුදා භට කන්ඩායම් වලට හැකිවිය. ඒ සඳහා අවශ්‍ය වෛද්‍ය කණ්ඩයම් සූදානම් කරද්දී ඉන්දීය රජය තම රටවැසියන් ගුවන් මගින් මුදාගත්හ. වුහාන් නගරයේ සිටි සිසුන් රැගෙන ඒමට ගුවන් යානයක් ගොඩබැස්සවීමට මීලඟ අවස්ථාව ලැබුනේ ශ්‍රී ලංකාවටය.

